# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1980/42 - 2016 අගෝස්තු මස 19 වැනි සිකුරාදා - 2016.08.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත

3 වැනි වගන්තිය යටතේ නියමය

1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය රවී කරුණානායක වන මම, මෙම නියෝගය මගින් එකී පනතේ 3 වැනි වගන්තිය යටතේ පනවන ලද 2016.05.19 වැනි දිනැති අංක 1967/52 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කරන ලද නියමයෙහි උපලේඛනය, පහත උපලේඛනය පරිදි සංශෝධනය කරමි.

රවී කරුණානායක,
මුදල් අමාත්‍ය.

2016 අගෝස්තු මස 18 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

*උපලේඛනය*

2016.05.19 දිනැති අංක 1967/52 දරන *අති විශෙෂ ගැසට් නිවේදනයේ* උපලේඛනයෙහි අයිතම 1 (ඉ) ට පසු පහත සඳහන් අයිතමයන් ඇතුළත් කරමින්,

| *අංකය* I | | *විස්තරය* II | *නිෂ්පාදන බද්ද* III |
|---|---|---|---|
| 1 | (ඊ) | දේශීයව නිෂ්පාදනය කල හෝ ආනයනය කරනු ලබන මෝටර් රථ,<br>2015.11.20 දින හෝ ඊට පෙර විශ්‍රාමලත් රජයේ නිලධාරියකු විසින් 2015.10.14 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 22/99 (xxxi) සහ ඊට අදළ පෙර සංශෝධන අනුව නිකුත් කරන ලද බලපත්‍රයක් උපයෝගී කර ගෙන මිලදී ගනු ලබන, | මිල, රක්ෂණය සහ ගැල් කුලිය ඇතුළත් (CIF) වටිනාකමින් 40% |
| | (උ) | දේශීයව නිෂ්පාදනය කල හෝ ආනයනය කරනු ලබන මෝටර් රථ,<br>2015.11.21 දින හෝ ඊට පසු විශ්‍රාමලත් රජයේ නිලධාරියකු විසින් 2016.06.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 22/99 (xxxii) අනුව නිකුත් කරන ලද බලපත්‍රයක් උපයෝගී කර ගෙන මිලදී ගනු ලබන, | ගෙවිය යුතු බදු ප්‍රමාණයෙන් 20% |
| | (ඌ) | දේශීයව නිෂ්පාදනය කල හෝ ආනයනය කරනු ලබන මෝටර් රථ,<br>රජයේ නිලධාරියකු විසින් 2016.07.14 දිනැති වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2016 අනුව නිකුත් කරන ලද බලපත්‍රයක් උපයෝගී කර ගෙන මිලදී ගනු ලබන, | ගෙවිය යුතු බදු ප්‍රමාණයෙන් 50% |

09 - 266